**ශීර්ෂය 268 - කිලිනොච්චිය  දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 20  දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට  කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ  මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා  ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1. 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණවල එකතුව රු. මිලියන 1,333.02ක් ලෙස දක්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට එය රු. මිලියන 1,312.22ක් ලෙසට ගෙනඒම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණවල එකතුවෙහි රු. මිලියන 20.8.ක වෙනසක් පැවැතුණි. | පරිගණක තොරතුරු පද්ධතියේ දෝෂයක් හේතුවෙන් මෙලෙස සිදුවී තිබුණි. | නිවැරදි කිරීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ NEW CIGAS ASSET Report for Final Accounts ප්‍රකාරව ඉවත් කළ ජංගම නොවන වත්කම් රු. මිලියන 7.01ක් ලෙස දක්වා තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4.09ක් ඉවත් කළ බවට අනාවරණය කිරීම හේතුවෙන් රු. මිලියන 2.92 ක වෙනසක් පැවැතුණි. | පරිගණක අන්තර්ජාලය හරහා භාගත නොකිරීම් හා ආරම්භක ශේෂ අඩුවෙන් දක්වා තිබීම නිසා මෙම වෙනස්කම් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්වීමට උචිත ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් ජංගම නොවන වත්කම්වල එකතුව රු. මිලියන 26.83ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 24.58ක් ලෙස අනාවරණය කිරීම හේතුවෙන් රු. මිලියන 2.25ක් වෙනසක් පැවැතුණි. | පරිගණක අන්තර්ජාලය හරහා භාගත නොකිරීම් හා ආරම්භක ශේෂ අඩුවෙන් දක්වා තිබීම නිසා මෙම වෙනස්කම් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්වීමට උචිත ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. මිලියන | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103 (1) | 0.246 | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සොරකම් කළ වර්ග 09ක අයිතම්වල පාඩුව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොලීසියේ පැමිණිලි කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

### 2.2 අත්තිකාරම් ලබාදීම හා නිරවුල් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තනතුරෙන් අස්වූ සහ විශ්‍රාම ගිය නිලධාරීන් 03ක ගෙන් අයවිය යුතු හිඟහිටි සේවක ණය එකතුව රු.මිලියන 0.72ක් පසුගිය වර්ෂ 01 සිට 12ක් දක්වා අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කපාහැරීමට සහ විශ්‍රාමික පාරිතෝෂිතයෙන් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතී. | ණය ශේෂ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂා කළ ප්‍රතිලාභ (Outcome) අත්කර නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනට අනුව 2021 වර්ෂයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 03ක පිරිවැයකින් ඉදිකළ වෙළෙඳපොල සංකීර්ණය අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට මහජනතාවට විවෘත නොකර පසුගිය වර්ෂයේ සිට අත්හැර දමා තිබුණි. | මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රයෝජනයට ගත හැකි ලෙස ඉදි කර අවසන් වූ වහාම විවෘත කර ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 54.51ක පිරිවැයකින් ඉදිකළ සමූපකාර සමිති 03ක් සහ ප්‍රජා මූලික සංවිධාන ආදියට භාරදුන් පොල් තෙල් නිෂ්පාදන මධ්‍යස්ථානය, වර්ග 04ක දේශීය නිෂ්පාදන කර්මාන්තයන් සඳහා වූ යන්ත්‍රෝපකරණ නියමිත අරමුණු සඳහා උපයෝජනය නොකර පසුගිය වර්ෂ 03 සිට 04ක් දක්වා කාලයක් අත්හැර දමා තිබුණි. | භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමට උචිත පියවර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් භාවිතා කළ ඉඩම් 12ක් ඒවාට අයත්ව නොතිබූ නමුත් එහි වටිනාකම එකතුව රු. මිලියන 232.1ක් පසුගිය වර්ෂ 05ක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, එම ඉඩම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හිමිකාරිත්වය ලබා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වලට අදාල නීතිමය ලිපිලේඛන ලබාගැනිමට කටයුතු කරමින් පවතී. | හිමිකාරිත්වය ලබා ගැනීමට හෝ පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගස් ප්‍රවාහනය සඳහා වන සංරක්ෂණ සම්පත් දෙපාර්තමේන්තුව මගින් කරවව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගස් ප්‍රවාහනය කිරීමට අවසර ලබාදීමේ සලකුණ සටහන් කිරීමට යොදාගත් මිටිය අතුරුදහන්වීම සම්බන්ධයෙන් වර්ෂ 03ක කාලයක සිට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පොලීසියේ පැමිණිලි කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මේ පිළිබඳව දැනුම් දී මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශන සිදුකර වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න තහවුරු කිරීමට කටයුතු කළ යුතුවේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක වර්ෂ 05කට අධික කාලයක් සේවය කළ නිලධාරීන් 123ක්, 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2021 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂ 05ක් ඉක්මවා ගොස් තිබූ නමුත් ස්ථාන මාරුවීම් නොලබා අඛණ්ඩව එකම සේවා ස්ථානයක සේවය කිරීමට අනුමත කර තිබුණි. | ස්ථාන මාරුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ස්ථාන මාරු කිරීමේ චක්‍රලේඛය අනුව කාර්ය මණ්ඩලය විමධ්‍යගත කිරීමට කටයුතු කළ යුතු වේ |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක තනතුරු 04ක පුරප්පාඩු 24ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවතුණි. | රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඍජුව දිවයින පුරා සිදුකළ සංවර්ධන නිලධාරීන්ට පත්වීම් ලබාදුන් අවස්ථාවේදි තනතුරු පුරප්පාඩු සැලැකිල්ලට නොගන්නා ලදී. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |